# සුනාමිය

"ඉනමුරා නෝ හී" ජපන් කථාව ඇසුරින් සැකසුණු පුංචිරාලගේ කතාවෙන් පාඩමක් ඉගෙන ගනිමු!



# 2004 දෙසැම්බර් 26 ඉන්දියන් සාගරයේ ඇතිවූ සුනාමි තත්ත්වය





ඉන්දියන් සාගර මුහුදු පතුලේ 2004 දෙසැම්බර් 26 වැනි දින දේශීය වේලාවෙන් පෙ.ව. 6.58 ට සිදුවූ භූචලනය නිසා හටගත් සුනාමි ව්‍යසනයෙන් මිනිස් ජීවිත ලක්ෂ දෙකකට අධික සංඛ්‍යාවක් විනාශ වූ අතර එය නූතන ඉතිහාසයේ වඩාම විනාශකාරී ව්‍යසනය ලෙස සටහන් වෙයි. මෙය රිච්ටර් මාපකයේ ඒකක 9.0 ක විශාලත්වයකින් සිදුවූ අතර මෙවැනි විශාල ව්‍යසන හතරක් පිළිබඳව 1900 සිට 1964 දක්වා වාර්තාවී ඇත. ඒ අතර විශාලතම ව්‍යසනය ලෙස 1964 දී රිච්ටර් මාපකයේ ඒකක 9.2 ක විශාලත්වයකින් යුතුව ඇලස්කාව අසල සිදුවූ භූචලනය සැලකේ.

මෙවර සිදුවූ භූ චලනය ඇති වූයේ ඉන්දියන් සාගරයේ පිහිටි ඉන්දුනීසියාවට අයත් උතුරු සුමාත්‍රාවේ බටහිර වෙරළට එපිටින් පිහිටි සුමියුලු දූපත්වලට උතුරිනි. එමගින් ඇතිවූ සුනාමි තත්වය නිසා මීටර් 30ක් පමණ උසට ඇදීගිය මුහුදු රළවලින් ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, දකුණු ඉන්දියාව, තායිලන්තය ඇතුළු ඉන්දියන් සාගරයේ අවට රටවල වෙරළ තීරයන්ට විශාල හානියක් සිදුවිය.

එමෙන්ම මෙහි බලපෑම නිසා අප්‍රිකාවේ නැගෙනහිර වෙරළ තීරය ද බරපතල ලෙස විනාශ වූ අතර සිදුවූ මරණ සංඛ්‍යාවද අති විශාලය. මෙම සුනාමි ව්‍යසනය නිසා සිදුවූ මරණ සම්බන්ධව ඉතා දුරස්ථම දත්තය වන්නේ භූමි කම්පන ප්‍රභව ලක්ෂ්‍යයෙන් කිලෝමීටර් 8000 ක් ඔබ්බට විහිද ගිය දකුණු අප්‍රිකාවේ එළිසබත් වරාය ආශ්‍රිතව සිදු වූ ජීවිත හානියයි.

# 1750 සිට 2004 දක්වා ලෝකයේ සිදුවූ සුනාමි ව්‍යසන දත්තයන්




1. 2004 ඉන්දියන් සාගරය ආශ්‍රිතව භූමිකම්පාව සහ සුනාමි ව්‍යසනය නිසා ලක්ෂ දෙකකට අධික මිනිස් ජීවිත අහිමි විය.
2. 1998 පැපුවා නිව්ගිනියාවේ එටාපි - මරණ 2,300
3. 1992 ඉන්දුනීසියා ෆ්ලෝරෙස් - මරණ 1,700
4. 1976 පිලිපීනයේ මෝරෝ ගල්ෆ් - මරණ 8,000
5. 1960 චිලී මහා භූමිකම්පාව - චිලී, ඇමරිකාව (හවායි) පිලිපීනය සහ ජපානය යන රටවල මරණ 5,700
6. 1933 ජපානයේ සන්රිකු භූමිකම්පාව සහ සුනාමිය - මරණ 3,000
7. 1906 චිලී - මරණ 3,760
8. 1896 ජපානයේ සන්රිකු භූමිකම්පාව සහ සුනාමිය - මරණ 22,000
9. 1883 ක්‍රකටෝආ ගිනිකඳු පිපුරුම හා සුනාමි ව්‍යසනය - මරණ 36,000
10. 1868 චිලී - මරණ 25,000
11. 1792 අන්සන් කන්දේ නායයාම සහ සුනාමිය - මරණ 15,200
12. 1771 රියුකියු අගලේ භූමිකම්පාව - මරණ 9,000
13. 1755 ලිස්බන් භූමි කම්පාව - මරණ 62,000

**සුනාමි විපතකින් ඔබගේ ජීවිත බේරාගන්නේ කෙසේද?**

තමුන්ගේ ජීවිතය සහ ගම්මුන්ගේ ජීවිත ගණනාවක් විශාල සුනාමියකින් බේරාගත් මිනිසකු පිළිබඳව කියැවෙන, "ඉනමුරා නෝ හී" නමැති ජපන් කථාව ඇසුරින් සැකැසුනු මෙම පුංචිරාලගේ කථාවෙන් අපි පාඩමක් ඉගෙනගනිමු.

# ගමමම බේරාගත් පුංචිරාලගේ කතාව

වයසින් පැරැන්නෙකු වුවත් තමන්ගේ කායික මෙන් ම මානසික ශක්තිය අතින් ද පුංචිරාල සිටියේ තාරුණ්‍යයේ ය. ඔහුගේ සහභාගීත්වයෙන් තොරව ගමෙහි සිදුවූ කිසිදු සුවිශේෂී වැඩ කටයුත්තක් පිළිබඳව මතකයට නගා ගැනීමට ගම්මුන් සමත්වූයේ නම් ඒ කලාතුරකිනි. එදිනෙදා ජීවිතයේ නිරතුරුව මුණගැසෙන විටකදී "ලොකුඋන්නැහේ" යනුවෙන් ඔහුට ආමන්ත්‍රණය කිරීමට බොහෝ දෙනා පෙළඹ සිටියේ ඔහු සමඟ පැවැති කුළුපග සම්බන්ධය කියාපෑමට වුවත්, ගමේ මුදල් හිමි බලවත් පුද්ගලයෙකු වීම නිසා "රාලහාමි" යන අන්වර්ථ නාමයෙනුත් ඔහු හැඳින්වීමට සමහරෙක් පෙළඹී සිටියහ.



ධීවර කර්මාන්තය තම ජීවිකාව කරගත් බහුතර පිරිසකට පුංචිරාලගේ උපදෙස් නිරන්තරයෙන් ප්‍රයෝජනවත් වුණා. ඒ නිසා තමන්ගේ එදිනෙදා වැඩකටයුතුවලදී පුංචිරාල ගමේ බොහෝ දෙනෙකුගේ ජීවතවල ප්‍රධාන කොටස්කරුවෙක් වුණා. ඒ වගේම අගහිඟ වෙලාවෙදි අතමාරුවක් ගන්නත් ගමේ උදවිය රාලහාමි ළඟට ගියා. බොහෝ දෙනාගේ ගෞරවයට පාත්‍ර වුණත් ඔහු ඉතා චාම් දිවි පැවැත්මක් ගත කළ පුද්ගලයෙක් ලෙස වෙනත් ගම්වල පවා කතාබහට ලක්වුණා. මිනිසුන්ගේ මෙම ගෞරවය ඔහුට හිමිවීමට බලපෑ එක් හේතුවක් වූයේ ඔහු ගමේ ප්‍රධානියා වීම වුණත් ඊට වඩා අනෙක් අයට උපකාර කරන වැදගත් පුද්ගලයෙක් වීම ප්‍රමුඛ සාධකයක් වුණා.

හුදකලා කන්දක් උඩ පිහිටලා තිබුණු, පුංචිරාලගෙ කඩේ ගමේ බොහෝ දෙනෙකුගේ එදිනෙදා අවශ්‍යතා සපුරමින් පුංචිරාල වගේම අනෙක් අයට උදව් උපකාර කිරීමට සැදී පැහැදී හිටියා. ඒ කඳුගැටය පිහිටල තිබුනෙ හුදකලාව නිසා කන්ද උඩ තිබුණ පුංචිරාලගෙ කඩයට ඈත පිහිටි මුහුද දැකුම්කළු දර්ශනයක් ගෙනාව. ඒ නිසා ඔහුගෙ කඩයට ආපු හැම කෙනෙක්ම වගේ ටික වෙලාවක් ඒ තුළ රැඳිල හිටියෙ මේ මනස්කාන්ත දර්ශනයෙන් වශී වුණ නිසයි. වෙනත් බොහෝ පුද්ගලයන්ට වෙනස්ව යමින් අනෙක් හැමෝගෙම හිත දිනාගනිමින් ඔහු තමන්ගේ කඩය හොඳින් පවත්වාගෙන ගියා.

කඩය වටේටත් බෑවුම දිගේත් කොළපාට ලඳු කැලෑවෙ අතරින් පතර ඉතා උස පොල් ගස් පිහිටල තිබුණා. ලුණු මිශ්‍ර මුහුදු සුළඟ නිසාත්, සරුපස නිසාත් පොල් ගස් නිරන්තරව සරුසාරව වැඩුනා. කන්ද මුදුනෙ ඉඳලා පහළට දිවෙන ක්‍රමාණුකූල බෑවුම අවසන් වුණේ වටරවුම් පාරකින්. පාරට සමාන්තරව පිහිටල තිබුණු ගඟේ තම තමන් විසින්ම හදාගත්තු ඔරු පදින්න ගමේ අය පුරුදු වෙලා හිටියා. ඒ වගේ වෙලාවක ඔරු පදින ළමයි දිහා බලාගෙන උන්නු පුංචිරාළට නිරන්තරයෙන්ම තමන්ගෙ ළමා කාලය සිහිවුණා. ඕනම වෙලාවක ගඟ දිහා බලන්න කෙනෙකුගෙ සිත එක්තැන් කරන්න තරම් ශාන්ත ආකාරයකිනුයි ගඟ ගලාගෙන ගියේ. ඒ නිසා බොහොමයක් හැන්දෑවරුවල තමන්ගෙ වැඩ ඉවර කරල කඩේ ඉස්සරහ තිබුණු බංකුවේ වාඩිවෙලා ගඟදිහා බලාගෙන ඉඳීමේ දීර්ඝකාලීන පුරුද්දක් පුංචිරාලට තිබුණා. ඒ වගේ වෙලාවක ටිකක් දුරින් පේන මුහුදයි ළඟ තියෙන ගඟයි අතර ප්‍රමාණයෙ වෙනස වගේම, ජළ පහරෙ වේගයෙ වෙනසත් සන්සන්දනය කරමින් ටිකක් වෙලා මේ දෙකම දිහා බලාගෙන ඉඳීමෙන් පුංචිරාල අසීමිත සතුටක් බුක්ති වින්දා.

ගෙවල් 50 කින් පමණ සමන්විත වුණ මේ ගමේ වැඩිහරියක් ගෙවල් පිහිටල තිබුණෙ ගං ඉවුරෙ ගොඩබිම පැත්තට වෙන්නටයි. තවත් ගෙවල් කිහිපයක් බෑවුම දිගේත් පිහිටල තිබුණා. මේ ගෙවල් අතර පරතරයක් ඇති කරන්න පැළඉණි වැටක් හෝ දකින්න ලැබුණෙ කලාතුරකින්. අනෙක් ගෙවල්වල හිටි අයත් එක්ක තිබුණු සාමකාමී බව නිසාම නගරවල වගේ උස තාප්පවලින් වට කරගෙන කොටුවෙන්න මේ ගමේ මිනිස්සුන්ට ඕන වුණේ නැහැ. රාළහාමිගෙ ගෙදර තිබුණු කන්දෙ ඉඳලා බලන කෙනෙකුට මේ ගෙවල් සේරම දැකගන්න පුළුවන් වුණාත් හැම ගෙයක්ම සාදා තිබුණෙ එක සමානව මැටි බිත්තිවලින් සහ පොල් අතු වහළකින් නිසා වෙන්කරල හඳුනගන්න අසීරු වුණා. ඒත් බෝධියත්, චෛත්‍යත් නිසා ගමේ පංසල අනෙක් ගොඩනැගිලිවලින් වෙන්කරල අඳුනගන්න කාටවත් අසීරු වුණේ නැහැ.



වෙනත් බොහෝ දිනවල වගේම එක හැන්දෑවක පුංචිරාල ඔහුගෙ කඩේ ඉදිරිපිට තිබුණු බංකුවෙ වාඩිවෙලා; ඈත මුහුදත් ගඟත් දිහාත් මාරුවෙන් මාරුවට බලමින් ලොකු කල්පනාවක හිටියා. මේ වගේ බොහෝ වෙලාවලදි තමන් ඉතා දුක් මහන්සියෙන් ගෙවපු තරුණ කාලය පිළිබඳ සිතුවිලි දාමයක ඔහු පැටලුණා. අද වෙනකොට ගමේ අනෙක් අයට වඩා මුදල් අගහිගකම්වලින් තොර පුද්ගලයෙකු බවට පත්වීමටත්, පොල් අතු සෙවිලි කළත් ගඩොලින් බිත්ති බැඳි කඩයක් සදා ගැනීමටත් තමන්ට හැකි වූයේ තරුණ වියේ දී වෙහෙස මහන්සිවී වැඩ කිරීම නිසා බවත් ඔහු නැවත නැවත මෙනෙහි කළා.

අද වෙනදට වඩා ශාන්ත දවසක්. පෝය නිසා ටිකෙන් ටික අඳුර වැටෙත්දි දවසෙ තිබුණ ශාන්ත බව වැඩිවෙනව නේද කියල පුංචිරාලට හිතුනා. පුංචිරාල හිටි තැන සිට කෙළින්ම පහළ බෑවුමෙ පංසල දැකගන්න පුළුවන්. පෝය දවස නිසා ගමේ හැමෝම පංසලට එකතුවෙනවා. අද ඊටත් වඩා විශේෂ දවසක් වුණේ ගමටත්, රටටත් සෙත්පතළ පංසලේ තිබුණු පිරිත් පිංකම නිසයි. හැම කෙනෙක්ම සුදු ඇඳුමින් සැරසිලා; තම තමන්ගෙ පවුල්වල ඔක්කොම කට්ටිය එක්ක එක පේලියට ගමන් කරනකොට පුංචිරාලගෙ හිතේ ඇතිවුණු ශාන්ත හැඟීම් තවත් වැඩිවුණා. හැම ගෙදරකම වහලෙ ජාතික කොඩි ලෙල දුන්නා. ඊයෙ දවසෙ ගමේ තරුණයෝ එකතු වෙලා කරපු වැඩ කටයුතු හැම එකකටම වගේ පුංචිරාල උදව් කළා. ඒ සැරසිලි නිසා ගමට අලුත්ම අලංරකායක් ලැබුණා.

පංසල් යන්න අවශ්‍ය කලමනා ගන්න ගමේ උදවිය ආපු නිසාත්, පසුගිය දවස්වල පිරිත සංවිධානය කිරීම වෙනුවෙන් ගොඩක් වෙහෙසිලා කටයුතු කරපු නිසාත් පිරිතට සහභාගිවෙන්න උවමනාව තිබුණත් පුංචිරාල හිතා හිටියෙ තව ටිකක් ගිමන් ඇරල රෑවෙලා පංසල පැත්තට යන්නයි.




මේ වෙලාවෙ පුංචිරාලගෙ ගෙදර අනෙක් අයත් පිරිත් අහන්න පන්සලට ගිහිල්ලා තිබුණ නිසා ගෙදර ඉතුරු වුණේ එයාගෙ අවුරුදු දහයක් වයස මුණුපුරා වන "නිමල්" විතරයි. පුංචිරාල ඉඳගෙන හිටිය බංකුව ළඟ වාඩිවෙලා සෙල්ලම් කරන ගමන් තමන්ගෙ හිතට එන නොයෙක් ප්‍රශ්න පුංචිරාලගෙන් අහන්න නිමල් පුරුදු වෙලා හිටියා. නිමල් ප්‍රශ්නයක් අහන වාරයක් වාරයක් පාසා පුංචිරාල තමන්ගෙ හිතුවිලිවලින් ඈත්වෙලා සැබෑ ලෝකෙට ආවා.

ඒ වෙනකොට බොහෝ වේලාවක් පුංචිරාල බංකුවෙ මත වාඩිවෙලා ඉඳල තිබුණා. එකපාරටම පරිසරයේ සිදුවෙන පුංචි වෙනසක් පුංචිරාලට දැනෙන්න පටන්ගත්තා. මුළු පරිසරයම එකවරම වෙනස් වෙමින් දිගින් දිගටම හමාගෙන ගිය සියුම් සුළඟ ටිකින් ටික වේගවත් වුණා. මුහුදුකරයේ දිගු කලක් ජීවත් වීම නිසා ගමේ වෙනත් අය වගේම පුංචිරාළත් මුහුදු තීරයේ නිතරම සිදුවෙන වෙනස්වීම් දැන සිටියා. ඒ නිසා පරිසරයේ මේ වෙනස ඒ තරම් කලබල වීමට දෙයක් නෙවෙයි. පුංචිරාල හිටි ඉරියව්ව වෙනස් නොකරම නැවතත් කල්පනාවට වැටුණා. ඒත් මොකක්දෝ අමුතු හැඟීමකින් ඔහුගෙ හිත පිරෙන්න පටන්ගත්තා.

ඒ එක්කම තමන් ඉඳගෙන හිටපු බංකුව ටික වෙලාවක් හෙලවෙමින් තිබුණ නේද කියා පුංචිරාලට හිතුනා. තමන්ට දැනුණු දේ ඇත්තක්ද, නැතිනම් සිතිවිලි මාත්‍රයක්ද කියල දැනගන්න වගේ පුංචිරාල නිමල් දිහා හැරිල බැලුවා. "සීයෙ මොකක්ද ඒ සද්දෙ. පොළොවත් හෙලවුණා නේද?" පුංචි නිමල් ඇහුවා. තමන්ට දැනුනෙ හිතලුවක් නොවන බවත් එය සැබෑම භූමිකම්පාවක් බවත් නිමල්ගෙ කතාවෙන් පුංචිරාල සැක හැර දැනගත්තා.

පුංචිරාළ තමන්ගෙ ඇඟිලිවලින් ඉස්සිලා ඈත මුහුද දිහා බැලුවා. හාත්පස පරිසරය අඳුරු වෙමින් පැවතුනා. වෙනත් දිනයකට වඩා වේගයෙන් ආපු රළ මුහුද තීරයෙ විශාල කොටසක් වහගත්තා. ඒත්, ඒ ක්ෂණයෙන්ම ඒ රළ මුහුද දිහාට වේගයෙන් ඇදුනා. පුංචිරාලට එයාගෙ ඇස් අදහාගන්න ඉඩක් නොතබාම නැවත මුහුද දිහාට ඇදී ගිය රළ පහර නිසා වෙරළෙ මහා විශාල කොටසක් හිස් වෙන්න පටන් ගත්තා.



පංසලේ ඉඳල මුහුදට ඒ තරම් දුරක් තිබුණෙ නැහැ. මුහුදෙ හදිසියෙ සිදුවෙමින් පැවති මේ පුදුමාකාර වෙනස දැකීමෙන් වශීවුණු ළමයින් එකිනෙකා පොරබදමින් වෙරළට දුවන්න පටන් ගත්තා. වෙනදට මහා ජලයෙන් වැහිල තියෙන මුහුදු තීරයෙ විශාල ප්‍රදේශයක වතුර හිඳිල තිබුණු නිසා කුඩා මාළු වෙරළෙ තැනින් තැන දඟලමින් හිටියා. තමන් කවදාවත් නොදැකපු සිප්පිකටු හැම තැනම. මේවායින් වශීවුණ ළමයින් තමන් ඇඳගෙන හිටපු සරම්වලට ගවුම්වලට ඒව එකතුකරන හැටි ඈත ඉඳල බලාගෙන හිටිය පුංචිරාල දැක්කා.

කවදාවත් මේ වගේ සිදුවීමකට මුහුණ දීල නොහිටපු නිසා පුංචිරාලත් පුදුම වුණා. ඒත් මොහොතකින් තමන්ට කුඩාකාලෙ සීය කියළ දීපු කතාවක් පුංචිරාලට මතක් වුණා. මේ වගේ මුහුදු රළ ගැඹුරු මුහුදට ඇදී ගියාම ටික වෙලාවකින් ඒව වඩා විශාල වෙලා නැවත ඇවිත් මුහුදු තීරය අවට තියෙන සියල්ල ඇදගෙන යනව කියල ඒ කතාවෙදි සීය ඔහුට කියල තිබුණා. පුංචිරාලට කිසිවක් කර කියා ගන්න බැරිවුණා. ඒත් ඔහු කලබල වුණේ නැහැ. දැන් ගමේ සියලු දෙනාගෙ ජීවිත පවතින්නෙ තමන් අතේ බව ඔහු දැනගත්තා.

ඔහුගෙ පළමු ප්‍රයත්නය වුණේ මේ පිළිබඳ පණිවුඩය ගම්මුන්ට යැවීමයි. පුංචිරාල උපායක් කල්පනා කළා. ඔහු අත්දෙක කට ළඟට තියලා තමන්ට පුළුවන්තරම් හයියෙන් ගම්මුන්ගෙ පැත්තට කෑගැහුවා. ඒත් ඒ අයගෙ අවදානය තිබුනෙ තමන් කවදාවත් නොදැකපු මුහුදෙ අසිරිමත් බව සමග එකතුවෙලා නිසා පුංචිරාලගෙ කෑගැසීම ඔවුන්ට ඇහුනෙ නැහැ. පුංචිරාල තවත් උපායක් කල්පනා කළා. දුවල ගිහිල්ල පංසලේ ඝණ්ඨාරය නාද කළොත් හැමෝගෙම අවධානය තමන්ට හිමි වන බව  ඔහු දැනගෙන හිටියා. ඒත් පංසල පිහිටල තිබුණෙ පහළ නිසාත් තමන්ට එතැනට යාමට වැඩි වේලාවක් ගතවන නිසාත් ඒ උපාය සාර්ථක නොවනබව ඔහුට තේරුණා.



ඔහු කඩේ ඇතුළට දිව්වා. එළියෙ ඉඳල එකපාරටම කඩයට ඇතුළුවූ නිසාදෝ ඔහුගෙ ඇස් නිලංකාර වුණා. පුංචිරාල කෑගැහුව "නිමල්, දුවල ගිහිල්ල ටෝච්එක ගේන්න." තම සීයාගේ කලබලය දැකීමෙන් වික්ෂිප්ත භාවයට පත්වුණත් නිමල්ට ටෝච් එක ගේන්න තත්පර කීපයක්වත් ගත වුණේ නැහැ. නිමල්ගෙ අතින් ටෝච්එක ඩැහැගත්තු පුංචිරාල තමන්ගෙ කඩේ ඇතුළට දිව්වා. ඔහු කඩයට ඇතුළුවුණේ දැඩි අවධානයකින් නිසා තමන් හොයමින් හිටපු භූමිතෙල් බූලිය එකවරම හඳුනාගන්න පුළුවන් වුණා. එය තමාගේ උරහිස මතට ගත්ත පුංචිරාල හනි හනිකෙ කඩේ වටේට භූමිතෙල් විසිරෙව්වා. බූලියෙ භූමිතෙල් ටික ටික අඩු වෙනකොට ඒක උස්සල වහලෙ උඩටත් භූමිතෙල් විසි කරන්න ඔහුට පුළුවන් වුණා. සුරුට්ටු බීමට ඇබ්බැහිවෙලා හිටපු නිසා නිතරම තමන්ගෙ ඉණේ ගිනිපෙට්ටියක් තබාගෙන ඉන්න ඔහු පුරුදු වෙලාහිටිය. මෙවැනි කලබලකාරී මොහොතකට එය පිහිට වේයෙයි ඔහු කවදාවත් හිතුවෙ නැහැ.

"සීයෙ ඇයි? මොනවද මේ කරන්නනේ..." ඇස් දෙකේ කඳුළු පුරව ගත්තු නිමල් පුංචිරාලගෙ අතේ එල්ලුනා. නිමල්ට පිළිතුරු දෙන්න තරම් වෙලාවක් පුංචිරාලට ඉතිරි වෙලා තිබුණෙ නැහැ. ඔහු නිමල්ගෙන් තම අත මුදාගත්තා. ඉක්මණින් ඉනෙන් ගිනිපෙට්ටිය ඇදල ගත්තු පුංචිරාල ක්ෂණයකින් ගිනිකූරක් දල්වල; භූමිතෙල් මතට විසි කළා. වහලෙ තිබුණු වියළි පොල් අතු ඉක්මනින්ම ඇවිලෙන්න පටන් ගත්ත. ඔහු ඒ දිහා මොහොතක් බලාගෙන හිටියා. ඒත් ඒ ගැන පසුතැවිලි වෙන්න කාලයක් ඔහුට තිබුණෙ නැහැ. ඔහු හිතමින් හිටියෙ තමන් අතේ තිබුණු ගම්මු තුන්සීයකගෙ ජීවිත බේරාගැනීමයි. ඊට වඩා කිසිවක් ඔහුට මතක් වුණේ නැහැ.



මුහුදෙ අසිරිය විඳිමින් හිටපු එක තරුණයෙක් හුදකලා කඳු ගැටය උඩ සිදුවෙමින් තිබුණු මහා විනාශය දැක්කා. අනෙක් තරුණයන් එකතු කරගෙන ඔහු තමන්ට හැකි වේගයෙන් පුංචිරාලගේ කඩය පැත්තට දුවන්න පටන්ගත්තා. කිසිවක් තේරුම්ගත නොහැකිවූ ගම්මුන් සියලු දෙනාම මේ සිදුවීමෙන් කලබල වෙලා පුංචිරාලගෙ ගෙදරට ඇදෙනව පුංචිරාල බලාගෙන හිටියා. කඩිසර කුඹි රංචුවක් වගේ කඳු බෑවුම දිගේ ඔවුන් ඉහළට ඇදෙමින් හිටියා. ඒ අතර තරුණයන්, තරුණියන්, මහල්ලන් හා ළමයින් වෙන්කර හඳුනාගැනීමට ඔහු සමත් නොවුනත් කහපාට සිවුරු දැකීමෙන් පංසලේ හාමුදුරුවන් සිටින බව පුංචිරාල දැනගත්ත.

ඉදිරියෙන්ම දුවගෙන ආපු තරුණ පිරිසක් එළවළු දමා තිබූ ගෝණි හිස්කර එයින් ගින්න නිවන්න උත්සාහ ගත්තා. තවත් පිරිසක් ළිඳ ළඟට දුවලා වතුර ගේන්න පටන් ගත්තා. "ගින්න ඔහේ තිබුනාවෙ, දැන් කඩේ බේරගන්න දෙයක් නැහැ. ඉක්මනින් ගම්මු හැමෝම ඉන්නවද බලපල්ලා. මට ඕන වුණේ ගමම මෙතැනට රැස් කරගන්නයි. භයානක විපත්තියක් සිද්ධ වෙන්නයි යන්නෙ. හැමෝම ආවද? පුංචිරාල කළබලයෙන් ඇහුවා.



"සීයට පිස්සු හැදිල, මට බයයි. සීය කඩේට ගිනි තිබ්බා." කඳුළු පුරවගත්තු දෙනෙතින් යුතුව නිමල් එයාගෙ අම්ම ළඟට දිව්වා. ක්ෂණිකව මහා කුණාටුවක් එක්ක පොල් ගස් දෙකක් විතර උස මුහුදු රළක් ඇවිත් කන්දෙ වැදුනා. චූටි පෙණ කැටිවලින් ගම්මු හැම දෙනාවම නෑවුණා. ගම්මුන්ගෙ කෑගැසීම විශාල ගෙරවුමකට වඩා සද්දෙන් විහිදුනා. කන්ද උඩ හිටිය නිසා කාටවත් කරදරයක් වුණේ නැහැ. මොහොතකින් හැමෝම කන්ද පහළ බැලුවා.

ජීවිත කාලයක් තමන් දුක් මහන්සියෙන් හරි හම්බ කරපු දේපොළ, වස්තුව පේන්න තිබුනෙ නැහැ. ඒ හැම දෙයක්ම නැවත නැවතත් ආපු මුහුදු රළ එක්ක ඈත ගැඹුරු මුහුදට ගහගෙන ගියා. පහළ නිම්නයේ මේතාක් තිබූ කිසිවක් ඒ විදියට ඉතිරිවෙලා තිබුනෙ නැහැ.

බොහෝ වේලාවක් යන තුරු කිසිවෙකුට කිසිවක් කියා ගන්න බැරිවුණා. ඔවුන් හැම දෙනෙක්ම මොහොතකට ගොළු වුණා. ගමේ විශාල ප්‍රදේශයක් චණ්ඩ මුහුදු රළෙන් ගිලගෙන තිබුණා. පුංචිරාල දැඩි නිහඬතාවය බින්දා. "මේ නිසා තමයි මම කඩේට ගිනි තිබ්බෙ." හීන් හඬින් ඔහු මිමිනුවා.



මිනිස් ජීවිත තුන්සිය ගණනක් වෙනුවෙන් ඔහු තමන් ජීවිත කාලයක් එකතු කරගත් සියලු ධනය අහිමිකරගත්තා. සියලු ධනය අහිමි වූ අනෙක් අය වගේම පුංචිරාල ඒ අය අතර බොහොම දිළිඳුව ඉඳගෙන හිටියා. ඔහු ළඟට ආපු මුණුපුරා තමන්ගෙන දෑත් එක් කරලා තමන් කරපු වරදට සමාව ඉල්ලුවා. සිදුවෙන්නට ගිය දෙය වටහා ගත නොහැකිව තමන් අතින් කියවුණු දේවල් සම්බන්ධව ඔහුට තමා ගැනම ලජ්ජා හිතුනා.

"අපි හැම දෙනාම මේ පැල, ටිකක් ලොකු කරල හදාගෙන දැනට මෙතැන ඉමු." තමන් මෙතෙක් ජීවත්වූ කඳුගැටයේ අනෙක් පැත්තෙ තිබූ පැල්කොටය පෙන්වා වචන සොයාගත හැකිවූ වහාම පුංචිරාළ කිව්වා.

නගරයත් සමඟ වැඩි සම්බන්ධතාවයක් නොතිබූ නිසාත්, අඩු පහසුකම් මත ජීවත් වූ නිසාත් ගම ඉක්මනින්ම ගොඩනැංවීමට ගම්මු අසමත් වුණා. ඒත් සියලුදෙනාගෙ එකමුතු බව හා මහන්සිය නිසා ටික කාලයකින් ගම සංවර්ධනය කිරීමට හැකිවුණා. ගමේ හැමෝම එකතුවෙලා පුංචිරාලගෙ කඩය නැවත හැදුවා. ගමේ තරුණයෝ එකතු වෙලා ඒකට අවශ්‍ය සියලු බඩු ගෙනත් දුන්නා. ඒත් කිසිම තෑග්ගකින්වත් කිසිම ප්‍රතිඋපකාරයකින්වත් පුරවන්න බැරි ලෙස තමන් පුංචිරාලට ණය ගැති බව ඔවුන් නිතරම හිතුවා.

ගමේ හැම කෙනෙක්ම ඔහුට සැලකුවෙ මරණයෙන් තමන්ව ගලවාගන්නට පැමිණි දෙවියෙක් ලෙසයි. ඔවුන්ට පුංචිරාලට දියහැකිවූ ඉහළම ගෞරවය එයයි. ඔහුගේ මරණයෙන් පසුවත් පුංචිරාල කළ මේ වික්‍රමය පිළිබඳ කතාන්තර ගමේ පරම්පරා ගණනක් තරුණයන් අතර තවමත් පවතිනවා.




# සුනාමියක් යනු කුමක්ද?

**1. සුනාමි ව්‍යසනයක් ඇතිවන්නේ කුමකින්ද?**

සුනාමි ව්‍යසනයක් ඇතිවීම සඳහා මූලික හේතුව වන්නේ මුහුදු ගර්භයේ ස්ථරයන්ගේ සිදුවන වෙනස්වීමකි. එය පහත පරිදි විවිධ ආකාරවලින් ඇතිවිය හැකිය.

i. මුහුදු ගර්භයේ ගිනිකඳු පිපුරුමක්.
ii. මුහුදු සීමාවෙහි හෝ මුහුදු පතුලෙහි සිදුවන නායයාමක්.
iii. භූචලනයක බලපෑමෙන් මුහුදු ගර්භයේ මතුපිට ස්ථරයන්ගේ ඇතිවන විරූපකරණයක්.


1883 අගෝස්තු මස මුහුදු පතුලෙහි සිදු වූ ගිනිකඳු පිපිරීමක් මගින් ජාවා සහ සුමාත්‍රා අතර පිහිටා ඇති ක්‍රකටෝආ දූපතෙහි, ඇතිවූ සුනාමි තත්වය නිසා ඉන්දුනීසියාවේ 36,000 කට අධික පිරිසක් මියගිය අතර එය වඩාත්ම බිහිසුණුකාරී ස්වාභාවික විපතක් ලෙස වාර්තාවේ.




1792 ජපානයේ උතුරු කියුෂු හි සිදුවූ භූමිකම්පාව නිසා නාය යෑමක් ඇතිවිය. මෙම භූමිකම්පාව සුනාමියක් ඇති වීමට තරම් ප්‍රමාණවත් නොවූවද, නායයාමේ සුන්බුන් මුහුදු බොක්කට වැටීම නිසා විශාල සුනාමි තත්වයක් ඇති වීමෙන් මිනිස් ජීවිත 15,000 ක් පමණ විනාශ විය.

කෙසේ වුවත් සෑම සුනාමියක්ම ඇතිවී ඇත්තේ භූචලනයක් හේතුවෙනි.


පොළව මතුපිට සමන්විත වන්නේ ප්‍රධාන භූගර්භ ස්ථර 07 ක් සහ තවත් කුඩා ස්ථර විශාල ගණනකිනි. මෙම ස්ථර මහාද්වීපික ගසාගෙන යාම නම් ක්‍රියාවලියක් හරහා දිගුකාලීනව චලනය වෙයි. භූතලයේ ඝණ කොටස් නිරන්තරයෙන් සහ සෙමින් චලනයකට භාජනය වීමෙන් සිදුවන භූමිකම්පාවල බලපෑම හේතුවෙන් ඇතිවන ආතතිය භූතලයේ ඝණ කොටස්වලට දරාගත නොහැක. මුහුදු පතුලේ භූමියෙහි සිදුවන ප්‍රබල වෙනසක් දරා ගැනීමට මුහුදු පතුළ අසමත් වීම නිසා ඇතිවන හදිසි පිපිරීමක් මගින් භූපටල විරූපකරණයක් ඇතිකෙරෙයි. මෙහිදී මහා පරිමාණ ලෙස මුහුදු වතුර එසවීමක් හෝ නැවත ඇද ගැනීමක් මගින් අවසානයේදී සියල්ල වනසා දමන සුනාමියක් නිර්මාණය වීම සිදුවෙයි.




සුනාමිය, භූ චලනයකට හෝ භූචලනයකින් සිදුවන ක්‍රියාවකට ළඟ සබඳතාවයක් දක්වයි.

## 2. සුනාමියේ පැතිරීම

භූකම්පාවක බලපෑමක් නොමැති ප්‍රදේශයක් වුවත් සුනාමියක බලපෑමකට ලක්විය හැකිය.






Propagation contours of the recent Indian Ocean tsunami on 26 December 2004

සුනාමි රළ මුහුදෙහි සාමාන්‍ය රළ පහරකට වඩා වෙනස්වේ. සුනාමියක දී මතුපිට රළ සෙලවීමකට වඩා සම්පූර්ණ මුහුදේ (කිලෝමීටර කිහිපයක් ගැඹුරට) විශාල චලනයක් සිදුවෙයි. එහිදී මුහුද අති විශාල ශක්තියක් ඒකරාශී කරගනියි. එයට කුඩා ශක්තියක් වැය කරමින් අධික වේගයකින් සාගරය හරහා විශාල දුරකට පැතිරයාමට හැකිය. සුනාමි ව්‍යසනයක් සිදුවූ වහාම එහි බලපෑම ඒ ආශ්‍රිත භූමි ප්‍රදේශයවලට පැතිරෙයි.

භූචලනයක් හෝ අනතුරු ඇඟවීමේ සංඥාවක් හෝ දැණුනු වහාම හැකි ඉක්මනින් ඉහළ ප්‍රදේශයකට හෝ උස් ගොඩනැගිල්ලකට යාම ඉතා වැදගත්ය.

සුනාමියක පැතිරයාමෙහි වේගය සාගර ජලයේ ගැඹුර මත රඳා පවතින අතර ඒවා අනුලෝම වශයෙන් සමගාමී වේ. ජලයේ ගැඹුර මීටර් 5,000 වන විට සුනාමියේ වේගය පැයට කිලෝමීටර 800 ක් පමණ වෙයි. එය ජෙට් යානයක වේගයට සමාන කළහැක. මහාද්වීපික ගල් පරයකට වඩා උසක් එනම් මීටර් 10 ක පමණ ගැඹුරක් ඇති ගොඩබිමට ආසන්න ප්‍රදේශයේ දී මෙය මෝටර් බයිසිකලයක වේගයට සමාන වූ පැයට කිලෝ මීටර 36 ක් පමණ වෙයි. එම නිසා රළ පැමිණීම දැකීමෙන් අනතුරුව ඉන් ගැලවීමට දුවන්නට පටන්ගත හොත් සුනාමියට ඔබව ඉතා ලෙහෙසියෙන් එයට ගොදුරුවිය හැක.



### ඉතා උසින් !

වෙරළ තීරයේ භූමි ස්වභාවය මත සුනාමියේ උස රඳා පවතී. සුනාමි යන වචනය "වරාය රළ" යන තේරුම ඇති ජපන් වචනයකි. එය ඇතිවී ඇත්තේ සුනාමි උත්පාදනය වන ආකාරය නිරීක්ෂණය කිරීමෙනි. එය වෙරළින් ඔබ්බෙහි දියඹේ දී පහත්වන අතර වරාය අසලදී ඉතා ඉහළට විහිදෙයි. එසේම තුඩුවක මුහුනතේදී හෝ මුහුදු බොක්කේ ඇතුලත දී සුනාමියේ උස අනෙක් ප්‍රදේශවලට වඩා විශාලය. සුනාමියක් ඇතිවූ විටෙකදී සාමාන්‍යයෙන් එකක් පසුපස එකක් ලෙස රළ කිහිපයක් පැමිණෙන බව හඳුනාගත යුතුය. සමහර අවස්ථාවලදී පළමු රළ පහර පැමිණෙන්නේ ඉතා සාමාන්‍ය ආකාරයෙනි. පසුව පැමිණෙන රළ ඉතා ප්‍රචණ්ඩ ආකාරයෙන් ඉහළම උසකින් පැමිණෙයි.

මුහුදේ ජලය අඩුවීමකින් තොරව සුනාමියක් ඇතිවිය හැකිය.

සාමාන්‍යයෙන් සුනාමියක් ඇති වීමට පෙර මුහුදෙහි ජලය අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි වුවත් සමහර විටෙකදී මුහුදේ ජල මට්ටම ඉහළ යාමකින්ම සුනාමියක් ආරම්භ විය හැකිය.


## 3. සුනාමියකින් ඔබගේ ජීවිත ආරක්‍ෂා කරගන්න.

ඔබට දැඩි භූචලනයක් හෝ දිගුකාලයක් සෙමින් පවතින දුර්වල භූචලනයක් හෝ දැනුණු විටකදී;

i. ඉක්මණින් මුහුදු වෙරළින් ඉවත්ව උස් බිමකට හෝ තට්ටු 3 කට වැඩි උස් ගොඩනැගිල්ලකට දුවන්න.
ii. රළ දකිනතුරු රැඳී නොසිටින්න.
iii. බඩුබාහිරාදිය අහුරා සකස්කරමින් නොසිටින්න.
iv. නෑමට හෝ මසුන් ඇල්ලීමට මුහුදු වෙරළට යෑමෙන් වලකින්න.
v. සුනාමිය නැවත නැවතත් පැමිණිය හැකි බැවින් ඔබ සිටින ආරක්ෂිත ස්ථානය තුළ අනතුරු තත්වය පහව යනතුරු පැය කිහිපයක් හෝ රැඳී සිටින්න.
vi. ගංගා අසලින් ඉවත්වී සිටින්න.

(දුරස්ථව සිදුවූ භූමිකම්පාවක දී ඔබට සෙළවීමක් නොදැනීමට පුළුවන. කෙසේ වුවත් සුනාමි අනතුරු ඇඟවීම ලද වහාම ක්‍රියාත්මක වන්න.)


### ඉක්මනින් උස් බිමකට දුවන්න




### සුනාමි පහරකෑමට ලක්වීමකට පෙර සූදානම් වීම:

1. ඉවත්වීමට හැකි ළඟම ආරක්ෂිත ස්ථානය හඳුනාගන්න.
2. ආරක්ෂිතව ඉවත්ව යාමට ඇති මාර්ගය හඳුනාගන්න.
3. පවුලේ පිරිස සමඟ සුනාමි පිළිබඳව සහ ඉවත්ව යාමේ සැලසුම් පිළිබඳව පූර්ව සාකච්ඡා සිදු කරන්න.

## 4. සුනාමියෙන් බේරීම සඳහා විවිධ ක්‍රමෝපායන්




සුනාමි ආපදා සිතියම නිර්මාණය කිරීම.



සුනාමියෙන් බේරී ආරක්ෂිතව ඉවත්වීම සඳහා ප්‍රජාව අතර වැඩමුළු සහ සාකච්ඡා පැවැත්වීම.



ඉවත්වීමේ පෙර පුහුණු පැවැත්වීම. "අපි ඉවත්වීමේ මාර්ග හඳුනාගනිමු."




සුනාමි ව්‍යසනය ඇතිවිය හැකියැයි අනුමාන ප්‍රදේශ හඳුනාගත හැකි වන ලෙස සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම.





ඉවත්වන මාර්ගය පෙන්වා දෙන සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම.




සුනාමි ව්‍යසනය පිළිබඳව චිත්‍ර වලින් සැරසූ පුවරු ප්‍රදර්ශනය කිරීම.



කඩොලාන වැඩි දියුණු කිරීම.




කෘතිම කඳු ගොඩනැංවීම





මුහුදු ආරක්ෂිත බැමි ඉදිකිරීම




මුහුදු වතුර නැවැත්වීම සඳහා ඉදිකිරීම.

### ඉක්මන් ඉවත්වීම් සඳහාවන හදිසි තොරතුරු ලබාදීමේ පද්ධතියක් ගොඩනැංවීම.



**Published by**

Asian Disaster Reduction and Response Network (ADRRN)

Asian Disaster Reduction Center (ADRC)

**With the support of**

The Government of Japan

**Distributed by**

Sarvodaya Shramadana Movement - Sri Lanka

Printed by Wisemen Lanka Consultants - Sri Lanka